(128ඇ)

බන්ධනාගාර

දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | |
|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව : බන්ධනාගාර | යොමු අංකය : ඩී8/21/බ.පරි/හෙද | දිනය : 2014.10.16<br>2015.06.24<br>2018.09.27 |
| 1.2 | පැරණි අමාත්‍යාංශය : බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය<br>නව අමාත්‍යාංශය : අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | යොමු අංකය : MOJ/E22/බඳවා ගැනීමේ පරිපාටි/හෙද | දිනය : 2019.03.25 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය : DMS/B2/48/01/Vol-II<br>DMS/1146/Vol-II | දිනය :2013.09.24<br>2018.05.30 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය : EST-2/RECRU/05/ 4818 | දිනය : 2020.10.28 |
| 1.5 | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : NSCC/3/40/94/SR | දිනය : 2018.11.15 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය : PSC/EST/07-01-18/01/2019 | දිනය : 2022.08.16 |

**02. පත්කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : හෙද සේවය/හෙද සේවයේ විශේෂ ශ්‍රේණිය

3.2. ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය **භාරය පිළිබඳ පොදු නිර්වචනය :**

රෝග නිවාරණය, සෞඛ්‍ය අභිවර්ධනය, වේදනාවන්ගෙන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ කාර්යය කිරීම පිණිස මූලික මිනිස් අවශ්‍යතා හඳුනා ගනිමින්, විද්‍යාත්මක මූලධර්ම පදනම්ව, රෝගී සත්කාර සේවා, ප්‍රජා / මානසික හෙද සේවා ක්ෂේත්‍රයෙහි මනා ක්‍රියාකාරීත්වය සඳහා ඉවහල් වන්නා වූ සුවිශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන්ද උපකාරක හෝ පහසුකාරක කාර්යයන්ගෙන් ද සමන්විත වන්නා වූ ක්‍රියාවලියකි.

3.4 **කාර්යයන් පැවරීම :**

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :**

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MT 8 – 2016

5.2. වැටුප් පරිමාණය : රු.50,200 – 10 x 1345 – 8 x 1630 – 76,690 /-

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | පියවර 04 | 54,235/- |

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාමය හා අනුමත තනතුරු සංඛ්‍යාව :

| තනතුරු නාමය | අදාළ වන සේවය | වැටුප් කේතය | ශ්‍රේණිය/පන්තිය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | දෙපාර්තමේන්තුගත | MT 8 | විශේෂ ශ්‍රේණිය | 01 |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : විශේෂ ශ්‍රේණිය - 1

07. බඳවා ගැනීමේ ක්‍රමය - අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම -අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. ජාතික හෙද අධ්‍යාපන ආයතනය/ පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/ මානසික හෙදකම අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.1.2 උසස්කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව හා ජ්‍යෙෂ්ඨතාවය අනුව හෙද සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරට පත් කිරීම : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන පොදු අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ

අර්ථ නිරූපණ:

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටිවල දැක්වෙන අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම ~~බඳවා ගැනීම්~~ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන ; අදාල නොවේ

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සකස් කළේ : අත්සන ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2022.10.

කොළඹ 09.

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

පරීක්ෂා කළේ : අත්සන : ..................

නම : ..................

තනතුර : ..................

දිනය : 2022.10.

කොළඹ 09.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..................

තනතුර : ..................

නිල මුද්‍රාව: ..................

කොළඹ 09.

දිනය: 2022.10.

යොමු අංකය : SMPMPR/AD-II/02/Pr Hq/ බ.ගා.ප. ශාඛා

2022.08.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරි විශේෂ ශ්‍රේණියේ තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

අත්සන :
නම :
ලේකම්
:අමාත්‍යාංශය
නිල මුද්‍රාව:

දිනය : 2022.10.02

---

යොමු අංකය : PSC/EST/07-01-18/01/2019

බන්ධනාගාර දෙපාර්තමේන්තුව හි විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි තනතුර සඳහා වන මෙම උසස් කිරීමේ පටිපාටි 2022.08.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :
නම : එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

නිල මුද්‍රාව:

දිනය : ~~2022.10.~~
2022.12.08